## පළමුවන කියැවීම

2 සාමුවෙල් 12:7-10, 13

සාමුවෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ දෙවන පොතෙන් ගත් පාඨයෙකි.

**"සමිඳාණෝ ඔබට කමාවන්නාහ. ඔබ නොනසින්නෙහි ය."**

එවිට නාතාන් දාවිත්ට මෙසේ කීවේ ය: "ඒ මිනිසා ඔබ තමයි; එබැවින් ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක: 'මම නුඹ ඉශ්රායෙල්වරුන්ගේ රජු වශයෙන් අභිෂේක කර, මම ම නුඹ සාවුල් අතින් ගළවා ගතිමි. මම නුඹේ ස්වාමියාගේ වංශය ද ඔහුගේ භාර්යාවන් ද නුඹට ම දිනිමි. ඉශ්රායෙල් හා ජුදා වංශයත් නුඹට දිනිමි. මෙය නුඹට ප්‍රමාණවත් නොවන්නේ නම්, මෙවැනි තවත් දේ මම නුඹට දෙන්නෙමි. නුඹ ස්වාමින් වහන්සේගේ ඇස් හමුයෙහි නපුරු දේ කිරීමෙන් උන් වහන්සේගේ වචනය සුළු කොට සිතුවේ කුමක් නිසා ද? නුඹ හිත්තීය ජාතික උරියා කඩුවෙන් නසා, ඔහුගේ බිරිඳ නුඹේ බිරිඳ වශයෙන් ගත්තෙහි ය. නුඹ අම්මොන්වරුන් ලවා ඔහු කඩුවෙන් මැරෙව්වෙහි ය. ඉතින් මා සුළු කොට සිතා, හිත්තීය ජාතික උරියාගේ බිරිඳ නුඹේ බිරිඳ වශයෙන් ගත් බැවින් කඩු පහර කිසි කලක නුඹේ වංශයෙන් පහ නොවන්නේ ය.' එවිට දාවිත් පිළිතුරු දෙමින්, "මම සමිඳාණන් වහන්සේට විරුද්ධ ව පව් කෙළෙමි"යි නාතාන්ට කී ය. නාතාන් ද කතා කරමින්, "සමිඳාණන් වහන්සේ ඔබේ පාපයට ක්ෂමාව දුන් සේක; ඔබ නොනසින්නෙහි ය" යි කී ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 32:1-2, 5, 7, 11

පිළිතුර: සමිඳුනි, අපගේ පාප දෝෂ කමා කළ මැනව.

ගීය: අපරාධයට සමාව ද පාපයට සමාව ද ලත් මිනිසා ආසිරි ලද්දෙකි. වරදක් ගැන සමිඳුන්ගෙන් චෝදනාවක් නොලබන, වංක සිතක් නොමැති මිනිසා ආසිරි ලද්දෙකි.

මාගේ පව් නොසඟවා මම පාපෝච්චාරණය කෙළෙමි. "හිමි තුමන්ට මාගේ පව් කියන්නෙමි"යි කීමි. ඔබ ද මාගේ පාප දෝෂ කමා කළ සේක.

මා රැකවරණය ඔබ ය; දුක් දොම්නසින් ඔබ මා රක්නා සේක. විමුක්ති ගීත මා අවටින් මතු වෙයි. දැහැමිනි, හිමි තුමන් කෙරේ ප්‍රීති වී උදන් අනන්න. අවංක සිත් ඇති සියල්ලෙනි, ප්‍රීති ඝෝෂා පවත්වන්න.

## දෙවන කියැවීම

ගලාති 2:16, 19-21

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**"මා වසන්නේ මගේ ජීවිතයෙන් නොව ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයෙනි."**

එහෙත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් මිස ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් මනුෂ්‍යයෙකු ධර්මිෂ්ට කරනු නොලබන බව අපි දනිමු. ඒ නිසා ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් නොව, ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ධර්මිෂ්ට කරනු ලබන පිණිස, ක්‍රිස්තුන් වහන්සේ අදහාගතිමු. ව්‍යවස්ථාවේ ක්‍රියාවලින් කිසි මනුෂ්‍යයෙක් වත් ධර්මිෂ්ට කරනු නොලබයි. ඇරත් දෙවියන් වහන්සේ උදෙසා ජීවත් වන පිණිස මම ව්‍යවස්ථාවට කීකරු වන අතර ව්‍යවස්ථාව මළ දෙයක් ලෙස සලකා එය

ප්‍රතික්ෂේප කෙළෙමි. මම ක්‍රිස්තුන් වහන්සේ සමග කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටිමි; ඉතින් දැන් ජීවත් වන්නේ මා නොවේ; ක්‍රිස්තුන් වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද මා දැන් මාංශයෙහි ජීවත් වන ජීවිතය මට ප්‍රේම කළ මා උදෙසා සිය දිවි දුන්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි. දෙවියන් වහන්සේගේ කරුණාව නිෂ්ප්‍රභා නොකරමි. මන්ද, ව්‍යවස්ථාව මගින් දේව සබඳතා ඇති කරගත හැකි නම් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයේ තේරුමක් නැත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 14:6

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද සත්‍යය ද ජීවනය ද මම වෙමි; මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නෝ ය"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 7:36-8:3

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඇය බොහෝ ප්‍රේම කළ බැවින් ඇගේ පව් කමාකරන ලදී."**

එක් පරිසිවරයෙක් තමා සමඟ ආහාර වළඳන පිණිස ජේසුස් වහන්සේට ආරාධනා කෙළේ ය. උන් වහන්සේ පරිසිවරයාගේ ගෙදරට වැඩම කර, කෑමට හිඳගත් සේක. ඒ නුවර විසූ පව්කාර ස්ත්‍රියක් උන් වහන්සේ පරිසිවරයාගේ ගෙදර කෑමට වැඩහුන් බව දැන, සුවඳ විලවුන් පිරුණු කිරිගරුඬ කරඬුවක් රැගෙන එතැනට ආවා ය. ඈ උන් වහන්සේ පිටිපසින් පාමුල සිට හඬ හඬා, උන් වහන්සේගේ පාද කඳුළෙන් තෙමන්ට පටන්ගෙන, ඇගේ හිසකේවලින් පිසදමා, උන් වහන්සේගේ පාද සිඹ, සුවඳ විලේපනයෙන් ආලේප කළා ය. උන් වහන්සේට ආරාධනා කළ පරිසිවරයා ඒ දැක: "මොහු දිවැසිවරයෙක් නම් තමාගේ ඇඟට අත තබන මේ පව්කාර ස්ත්‍රිය කවර තැනැත්තියක් ද කෙබඳු අඟනක් ද කියා දැනගනු ඇතැ"යි සිය සිතින් සිතුවේ ය. ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "සීමොන්, ඔබට කිය යුතු කරුණක් ඇතැ"යි වදාළ සේක. ඔහු ද, "ගුරුදේවයෙනි, වදාළ මැනවැ"යි කී ය. උන් වහන්සේ කතා කොට, "මුදල් ණයට දෙන එක්තරා මිනිසෙකුට ණයකාරයෝ දෙදෙනෙක් සිටියහ. එක් කෙනෙක් රිදී කාසි පන් සියයක් ද, අනිත් තැනැත්තා පණසක් ද ණය ව සිටියෝ ය. ණය ගෙවීමට ඔවුන්ට කිසි වත්කමක් නැති වූයෙන් ඔහු ඒ දෙදෙනාට ම කමා කෙළේ ය. එබැවින් ඒ දෙදෙනාගෙන් කවරෙක් ඔහුට වැඩියෙන් ප්‍රේම කරනු ඇද්ද"යි ඇසූ සේක. සීමොන් උත්තර දෙමින්, "ඔහු, යමෙකුට වැඩියෙන් කමා වූයේ ද, ඒ තැනැත්තා යයි මම සිතමි"යි කී ය. එවිට උන් වහන්සේ, "ඔබේ පිළිතුර හරි ය"යි ඔහුට කියා, ස්ත්‍රිය දෙසට හැරී, සීමොන්ට කතා කොට, "මේ ස්ත්‍රිය ඔබට පෙනෙනවා නොවේ ද? මම ඔබේ ගෙදරට ඇතුළු වුණෙමි, ඔබ මාගේ පාද සේදීමට වතුර නුදුන්නෙහි ය. එහෙත් මැ සිය කඳුළින් මාගේ පාද තෙමා සිය හිසකේවලින් ඒවා පිසදැමුවා ය. ඔබ මා සිම්බේ නැත. එහෙත්, මැ මා ආවේලේ පටන් මාගේ පාද සිඹීම නතර නොකළා ය. ඔබ මාගේ හිස තෙලින් ආලේප නොකෙළෙහි ය. එහෙත්, මැ මාගේ පාද සුවඳ විලේපනයෙන් ආලේප කළා ය. එබැවින් මම ඔබට කියමි, ඇගේ බොහෝ වූ පව් ඇයට කමා කරන ලද බව ඈ මට දැක් වූ ඇගේ ඉමහත් ප්‍රේමයෙන් ඔප්පු වේ. එහෙත්, යමෙකුට ස්වල්ප වශයෙන් කමා කරනු ඇද්ද,

ඔහු ස්වල්ප වශයෙන් ප්‍රේමය දක්වනු ඇතැ"යි වදාළ සේක. එවිට උන් වහන්සේ, "ඔබේ පව් ඔබට කමා කරන ලද"යි ඇයට වදාළ සේක. උන් වහන්සේ සමග කෑමට සිටි අය, "පව් කමාව දෙන මොහු කවරෙක් ද"යි තම තමන් අතර විමසූ හ. එහෙත් උන් වහන්සේ, "ඔබේ ශ්‍රද්ධාව ඔබට ගැළවීම ගෙන දුන්නේ ය, ශාන්ති සිතින් යන්නැ"යි ඒ ස්ත්‍රියට වදාළ සේක. (ඉන්පසු ජේසුස් වහන්සේ ධර්ම දේශනා කරමින් ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුබ අස්න ප්‍රකාශ කරමින් ද නගර සහ ගම්වල සැරිසැරූ සේක. උන් වහන්සේ සමග ගෝලයෝ දෙළොස්දෙනා ද අශුද්ධාත්ම කෙරෙන් හා ලෙඩ රෝගවලින් සුවය ලත් සමහර ස්ත්‍රීහු ද තමන් කෙරෙන් යකුන් හත් දෙනෙකු දුරු කරනු ලැබූ මග්දලේනා නම් ලත් මරියා ද හෙරොද්ගේ භාණ්ඩාගාරික වන කුසාගේ භාර්යාව වන ජෝවන්නා ද සුසානා ද සිය සම්පතින් උන් වහන්සේට උපස්ථාන කළ තවත් බොහෝ ස්ත්‍රීහු ද සිටියහ.)

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.